# 27

# පොළොන්නරුව ගල් විහාරයේ බුදු පිළිමවල රූපභේද

*බී. ඩී. සී. ආර්. බටුගෙදර* [1]
*ආර්. ඩී. එච්. පී. තිලකරත්න* [2]
HS/2013/0090, HS/2013/1072

ලාංකේය බුදු පිළිම නිර්මාණ ශිල්පයේ සුවිශේෂී රූපභේද ලක්ෂණ රැසක් පොළොන්නරු රාජධානියට අයත් බුද්ධ ප්‍රතිමාවලින් විද්‍යමාන වේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පොළොන්නරුව ගල් විහාරයේ ප්‍රතිමාහි දැක ගත හැකි සුවිශේෂ රූපභේද මොනවා දැයි යන්න අධ්‍යයනය කිරීමයි. ගල් විහාරයේ නිසින්න පටිමා ලෙන ට අයත්, විද්‍යාධර ගුහාවෙහි සහ නිපන්න පටිමා ගුහාවෙහි ඇති හිඳි බුදු පිළිම, හිටි පිළිමය සහ සැතපෙන පිළිමය මේ අධ්‍යයනය සඳහා භාවිත කළ මූලාශ්‍ර වේ. මෙම බුද්ධ ප්‍රතිමාවල දැකිය හැකි රූපභේද ලක්ෂණ අතර රවුම් මුහුණ, පිරිපුන් ග්‍රීවය, පටු නළල් තලය, ඍජු නාසය, සීහපුබ්බද්ධකාය, ආසන ක්‍රම, මුද්‍රා, ප්‍රභා මණ්ඩලය, චීවරයේ දක්වා ඇති ද්විත්ව රැළි, මකුටය දක්වා දිවෙන කුණ්ඩලාකාර හිසකෙස්, සැරසිලි හා කැටයම් අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවෙන් මෙම ප්‍රතිමා වෙන්කොට හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ වේ. එසේම හිඳි බුද්ධ රූ පසු පසින් නිර්මාණය කර ඇති අණ්ඩාකාර ප්‍රභා මණ්ඩලය මෙන් ම උඩැලිපත් ත්‍රිත්වයකින් සමන්විත මකර තොරණ ද නිසින්න පටිමා ලෙනෙහි කැටයම් කර ඇති චාමරධාරීන්, සිතුවම් කර ඇති දේව රූප ද පොළොන්නරු යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවල කැපී පෙනෙන ලක්ෂණ වේ. බොහෝ දෙනාගේ මතය නම්, ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමාවල රූපභේද මඟින් මහායාන බෞද්ධාගමික ලක්ෂණ ප්‍රතීයමාන වන බවයි. උඩැලිපත් සහිත මකර තොරණ, ආසනයෙහි කැටයම් කර ඇති සිංහ හා මහායාන ධර්මයේ සංකේතය වන වජ්‍ර ලකුණ, තොරණෙහි කර ඇති විමාන සතරෙහි මහායාන බෝසත්වරුන් කැටයම් කර තිබීමෙන් ගල් විහාරයේ බුද්ධ රූපයන්ගේ රූපභේද ලක්ෂණ තුළින් මහායාන ලක්ෂණ නිරූපණය වන බවට නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ නිසින්න පටිමා ලෙන, ගල් විහාරය, නිපන්න පටිමා ගුහාව, මහායාන බුද්ධ ධර්මය, වජ්‍ර ලකුණ

*1 දෘශ්‍ය කලා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර*
*2 දෘශ්‍ය කලා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර* hansikapthilakarathna1994@gmail.com